## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරනු ලබන සාම ප්‍රකාශය

අද, අප මාතෘ භූමිය තුළ පෙර නොවූ විරූ ආකාරයෙන් ඉඩ ප්‍රස්ථා රැසක් නිර්මාණය වී තිබේ. ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය අවසන් වී ඇත. ගැටුමෙන් විනාශයට පත් සියලු දෑ පිළිසකර කිරීම සඳහා සහ සියලුදෙනා උදෙසා තිරසාර සාමය හා සුරක්ෂිතභාවය ගොඩ නැඟීම සඳහා කාලය හා අවකාශය අප වෙත එළඹ ඇත. සියලුදෙනාටම ප්‍රජාතන්ත්‍රවාදයේ හා පුරවැසිභාවයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස භුක්තිවිඳිය හැකි බව සහතික කිරීමෙහි ලා මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම දැන් අප සතු කාර්යක් වෙයි.

අපගේ ජාතියේ 67 වන නිදහස් දිනය සමරන මේ මොහොතේ, දශක තුනකට වැඩි කාලයක් මුළුල්ලේ මෙම ඛේදජනක ගැටුම හේතු කොටගෙන ජීවිත අහිමි වූ, සියලු ජනවර්ග හා ආගම්වලට අයත් මෙරට සියලු පුරවැසියන්ටත්, රටට නිදහස ලැබූ දා පටන් ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් සියලුදෙනාටත් අපගේ කණගාටුව හා උපහාරය පුද කර සිටිමු.

ජාතික අභිලාෂයන්, ජාතික සංහිඳියාව, සියලු පුරවැසියන් සඳහා සාධාරණත්වය හා සාමානාත්මතාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී මාර්ග හරහා සියලු පාර්ශ්වයන්හි එකඟත්වය ලැබෙන ප්‍රවේශයන් අනුගමනය කරන බවට මෙම ගරු කටයුතු අවස්ථාවේදී ප්‍රතිඥා දෙමු. අපගේ බහුවිධ සමාජ ප්‍රගතිය හා සංවර්ධනය උදෙසා ජාතියේ එක්සත්භාවය හා භෞමික අඛණ්ඩතාවය අප විසින් රැක ගත යුතු අතර මෙම ක්‍රියාවලිය සහනශීලීත්වය, අනුග්‍රහය සහ එකඟතාවය තුළින් සිදු කරන්නෙමු. නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමටත්, මෙරටේ විවිධ ප්‍රජාවන් අතර මිත්‍රත්වය හා සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමටත්, සියලු අවස්ථාවන්හිදී සාම මාවතේ පියනැඟීම සඳහා පරිශ්‍රම දැරීමටත් අපි ප්‍රතිඥා දෙමු.

මෙම මාතෘ භූමිය එහි පුරවැසියන්ගේ රුධිරයෙන් තෙත් වීමට නැවත කිසිකලෙක ඉඩ නොතබන බවට සහතික කරනු වස් සාමූහිකව ඇප කැප වන බවට අපි පොරොන්දු වෙමු.

2/k